[illegible] වගන්ති 67(1) වන පරිදි 1-වි.
විරුද්ධව ගොනු කළ චෝදනා, පැමිණිල්ලෙන් ඉල්ලා දුන් පරිදි කාර්යාලයට ඉල්ලා
ඉල්ලා අස්කර ගැනීමට අවසර දෙමි.

2, 3, 4 හා 5 චූදිතයින් විරුද්ධව ගොනු කළ
චෝදනා අ.න.වි.ස. 194(3) වන පරිදි
ඉල්ලා අස්කර ගැනීමට අවසර දෙමි.

ඒ අනුව [illegible] වගන්ති 67 වන
පරිදි චෝදනා ඉල්ලා අස්කර ගැනීම මත
1-වි. නිදහස් කරමි.

අ.න.වි.ස. 194(3) වන පරිදි අයි.
චෝ. ඉල්ලා අස්කර ගැනීම මත 2, 3, 4 හා 5
චූදිතයින් නඩුවෙන් නිදහස් කරමි.

— අත්සන [illegible]

[illegible]

17/12/2026 [illegible]

බස්නාහිර පළාතේ මහාධිකරණය
12 DEC 2025
උසාවි අංක 6
කොළඹ - 12

බස්නාහිර පළාත්බද මහාධිකරණ අංක 06 දිය.

මහාධිකරණ විනිසුරු එම්.එම්.එම්.මිහාල් මැතිතුමා ඉදිරිපිටදී ය.

සටහන් ගැනීම:-ලඝු ලේඛිකා එල්.එච්.ඉෂානි නිරංජලා

නඩු අංකය:-HCB 303/24 දිනය:-2025.12.10

විත්තිකරුවන් සිටී.

1 වන විත්තිකරු වෙනුවෙන් නීතිඥ නිපුන් නවරත්න මහතා සමග ජනාධිපති නීතිඥ ඩිලාන් රත්නායක මහතා පෙනී සිටී.

2 වන විත්තිකරු වෙනුවෙන් නීතිඥ මලිඳු පීරිස් මහතා සමග නීතිඥ දිනුක් සෙනරත් බණ්ඩාර මහතා පෙනී සිටී.

3,5 විත්තිකරුවන් වෙනුවෙන් නීතිඥ රජිත් අබේසේකර මහතා සමග, නීතිඥ ශාලික ගුණවර්ධන මහතා, ජනාධිපති නීතිඥ නලින් ලද්දුහෙට්ටි මහතා පෙනී සිටී.

4 වන විත්තිකරු මිය ගොස් ඇත.

පැමිණිල්ල වෙනුවෙන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නියෝජ්‍ය අධ්‍යක්ෂක ජෙනරාල් අසිත ඇන්තනී මහතා පෙනී සිටී.

බස්නාහිර පළාතේ මහාධිකරණය
12 DEC 2025
උසාවි අංක 6
කොළඹ - 12

Scanned with CamScanner

පැමිණිල්ල විසින් ගොනු කරන ලද මෝෂන් පත්‍රයක් මත විත්තිකරුවන්ට නොතිසි නිකුත් කර ඇත.

ඒ අනුව 1,2,3,5 විත්තිකරුවන් අධිකරණයේ පෙනී සිටී.

පැමිණිල්ල වෙනුවෙන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නියෝජ්‍ය අධ්‍යක්ෂක ජෙනරාල් අසිත ඇන්තනී මහතා මෙසේ කරුණු දක්වා සිටී.

ගරු මැතිතුමනි මෙම නඩුව සම්බන්ධයෙන් 1 වන චූදිත වන අජිත් නිවාඩ් කබ්රාල් යන අයගේ ජනාධිපති නීතිඥ ඩිලාන් රත්නායක මහතා විසින් ලිඛිතව ඉල්ලීමක් කරනු ලැබුවා මෙය දූෂණ විරෝධී පනතේ 67 වගන්තිය යටතේ සළකා බලන ලෙසට. ඒ අනුව කොමිෂන් සභාව විසින් හා අධ්‍යක්ෂක ජෙනරාල්වරයා විසින් මෙම ඉල්ලීම සළකා බැලීමෙන් අනතුරුව එම 67 වගන්තියේ 2,3 යන වගන්ති කෙරෙහි ද අවධානය යොමු කිරීමෙන් අනතුරුව 1 වන චූදිත වෙනුවෙන් ගරු අධිකරණයේ ගොනු කර ඇති අධිචෝදනා පත්‍රය ඉල්ලා අස් කර ගැනීමට ගරු අධිකරණයෙන් අවසර ඉල්ලා සිටිනවා.

එම දූෂණ විරෝධී පනතේ 63 (2) සහ (3) යන වගන්ති කෙරෙහි අවධානය කොමිෂන් සභාවෙන් යොමු කිරීමෙන් අනතුරුව කොමිෂන් සභාව විසින් මෙම අධිචෝදනා පත්‍රය ඉල්ලා අස් කර ගන්නා දින සිට මාස 3 ක කාල සීමාවක් ඇතුළත 1 වන චූදිත විසින් මෙම වරදට අදාළ වූ අලාභය ලෙස ගණනය කර ඇති මුදල රුපියල් මිලියන එක්දහස් අටසිය හතලිස් තුනක් සහ දෙලක්ෂ හැටහත්දාස් පන්සිය අනූපහයි ශත හැට පහක්(රු.1843267595.65/-) එම මුදල වන්දියක් හැටියට ශ්‍රී ලංකා මහ බැංකුවේ මුලස්ථානයේ ගිණුම් අංක

12 DEC 2025
උසාවි අංක 6
කොළඹ - 12

Scanned with CamScanner

65911 දරණ ගිණුමට බැර කිරීම මත මෙම අධිචෝදනා පත්‍රය එකී කොන්දේසි ගරු අධිකරණයෙන් ඉල්ලා අස් කර ගැනීමට අවසර පතනවා.

එකී කොන්දේසිය සපුරා ලීමට 1 වන විත්තිකරු අපොහොසත් වුවහොත් 67 (5) වගන්තිය යටතේ නැවතත් අධිකරණයේ අධිචෝදනා පත්‍ර ගොනු කිරීමට පියවර ගන්නා බව ද ගරු අධිකරණය වෙත දන්වා සිටිනවා.

2,3,5 යන චූදිතයන්ට එරෙහිව අපරාධ නඩු විධාන සංග්‍රහයේ 194 (3) වගන්තිය ප්‍රකාරව අධිචෝදනාවන් ඉල්ලා අස් කර ගැනීමට ගෞරවයෙන් අවසර ඉල්ලා සිටිනවා.

මෙම අවස්ථාවේදී අදාළ ලිඛිත කොන්දේසිය 1 වන චූදිතගේ විත්තියේ උගත් නීතිඥ මහතා වෙත විවෘත අධිකරණයේ භාර දෙනු ලබනවා.

1 වන චූදිත වෙනුවෙන් ජනාධිපති නීතිඥ ඩිලාන් රත්නායක මහතා සැලකර සිටිනුයේ,

ගරු උතුමාණනි, මෙම නඩුවේ 1 වන විත්තිකරු සම්බන්ධයෙන් නෛතික කරුණු හේතුකොට ගෙන මෙම චෝදනාව පවත්වාගෙන යා නොහැකි බවට මා විසින් දීර්ඝ සැලකිරීමක් ඉදිරිපත් කරනු ලැබුවා අල්ලස් කොමිසම වෙත. ඒ සැලකිරීමේ පිටපතක් මා ඔබතුමාගේ ගරු අධිකරණයටත් මේ අවස්ථාවේ ඉදිරිපත් කරනවා මන්දයත් මෙම නඩුවේදී දූෂණ විරෝධී පනතේ 67 වගන්තියේ ප්‍රතිපාදනුකූලව මා විසින් ලිඛිතව ඉල්ලීමක් කළා ඒ නෛතික සැලකිරීම සළකා බලන ලෙස.

ඒ අනුව, මා කරුණු දැක්වීමක් කළා මෙම නඩුවේ අපරාධ චෝදනාව කොහෙත්ම මාගේ විත්තිකරු සම්බන්ධයෙන් මම නියෝජනය කරන්නේ මගේ විත්තිකරු සම්බන්ධයෙන් පමණයි. මම [illegible] අනෙක්

12 DEC 2025

Scanned with CamScanner

විත්තිකරුවන්ටත් ඒක අදාළ වෙන් පුළුවන්. නමුත් මගේ විත්තිකරු සම්බන්ධයෙන් මෙම තැනැත්තාව අපරාධ චෝදනාවක් පවත්වාගෙන යාමට හෝ මේ දූෂණය කියන වරද සම්බන්ධයෙන් සාක්ෂි ඉදිරිපත් කිරීමටවත් නොමැති පසුබිමක් තමයි තිබෙන්නේ. ඒ නිසා මෙම නඩුව අපි දීර්ඝ නඩු විභාගයට ගිහිල්ලා ඔබතුමාගේ ගරු අධිකරණයේ නිසි ලෙස විත්තිකරුවන්ට විත්ති වාචකය ඉදිරිපත් කරලා අවසානයේදීත් අපි එන්නේ මුලින්ම ගන්න පුළුවන් තීරණයක් නම් ගරු අධිකරණයේ කාලය සහ රජයේ වටිනා කාලය අනවශ්‍ය ලෙස මිඩංගු කිරීමක් වන නිසා තමයි මා මේ ඉල්ලීම කරනු ලැබුවේ.

මේ අධිචෝදනා පත්‍රය හේතු 5 කට වැඩි ප්‍රමාණයක් අපි ඉදිරිපත් කරලා තිබෙනවා නෛතිකව පවත්වාගෙන යා නොහැකි වීමට හේතු. එම පසුබිම යටතේ අපි කොහෙත්ම අපේ විත්ති වාචකයේ කොහෙත්ම අපි පිළිගන්නේ නැහැ අපි මේ මුදල ආණ්ඩුවට ගෙවිය යුතුයි කියලා.

අපි කියා සිටින්නේ, මේ මුදල අපි ඕනෑ කමින් හිතාමතාම අධිචෝදනා පත්‍රයේ කියා තිබෙන ආකාරයට රජයට පාඩුවක් කිරීමේ අදහසකින් අපි මේ ගණුදෙනුවක් සිදු කළා කියන කරුණ අපි සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප කරනවා. ඒ නිසා අද දින උගත් නියෝජ්‍ය අධ්‍යක්ෂකතුමා විසින් ගරු අධිකරණයට කළ සැලකිරිම ගැන මා මුලින්ම සතුටු වූවත්, කොන්දේසියක් සහිතව ඒ සැලකිරිම කළ නිසා ඒ කොන්දේසි අපිට පිළිගන්න බැහැ. මොකද අපි මේ වරද පිළිගන්නේ නැහැ. මෙම නඩුව අභියෝගයට ගන්න නඩුව සටන් කරලා මේව කරන් පුළුවන්. අපි මේ කාලය නාස්ති කිරීමක් නොකරන්න තමයි අපි මේ නියෝජනය කළේ. මේ කොන්දේසියට එකඟ වෙන්න බැහැ. අපි ගත්තේ නැති මුදලක්. මේක ඇත්තටම වුණේ අයෝජන සම්බන්ධයෙන් මහ බැංකුවේ ඉන්නවා මොනට්‍රිබෝඩ් එක, ඒ විනිමය මුදල් මණ්ඩලය. ඔහු තමයි

12 DEC 2025

Scanned with CamScanner

හැමවෙලේම තීරණ ගන්නේ. මුදල් මණ්ඩලය මේ අවුරුද්දේ ගත්ත තීන්දු 10 ක් තිබෙනවා නම් ඒකෙන් 9 ක්ම සාර්ථකව ඒ තීන්දු වලින් ගත්ත අයෝජන වලින් ප්‍රතිලාභ ලැබුණා වාසිදායක.

ඒ අවුරුද්දේ තමයි වැඩිම ප්‍රතිලාභ ලංකාවට ලැබුණේ. ඒ ප්‍රතිලාභ ලැබිච්ච ගණුදෙනු අතර එක ගණුදෙනුවක් පමණක් අලාභයක් වුණා. ඒ ගණුදෙනුව සම්බන්ධයෙන් මාධ්‍යවල එක එක ආකාරයේ කතන්දර ගියා. ඒ හේතුව හින්දද මම දන්නේ නැහැ වැරදි තීරණයක් ගත්ත එක ඒ කියන්නේ අලාභයකින් අවසන් වෙච්ච ගණුදෙනුව සම්බන්ධයෙන් පමණයි මෙම නඩු පැවරීම කළේ. ඒ තමයි එක්මිලියන අටසිය හතලිස් තුන්ලක්ෂයක මුදලක් ගැන සඳහන් කරලා තිබෙනවා.

ඒ මුදල මහ බැංකුවේ අධිපති හැටියට මම කරපු ක්‍රියාවකින් ලැබිච්ච එකට මට ආපසු ගෙවන්න කියන එක හරිම අසාධාරණයි. මගේ ඉල්ලීමේ තිබෙන නෛතික කරුණු ඔබතුමාගේ අධිකරණයේ සළකා බැලුවත් අනිවාර්යෙන්ම මේ නෛතික කරුණු අනුව මේ අපරාධ චෝදනාව පවත්වාගෙන යන්න බැහැ.

මා ඉතාම ගෞරවයෙන් කියා සිටින්නේ, මගේ උගත් මිතුරා විසින් අද දින පැමිණිල්ල වෙනුවෙන් කළ සැලකිරීම ගැන මම යම් ආකාරයකට සතුටට පත් වුණත් ඒ තීරණයට කොන්දේසියක් අමුණා තිබෙනවා ඒ කොන්දේසියට අපි එකඟ වෙන්නේ නැහැ.

ඒ වගේම මා ගෞරවයෙන් සැලකර සිටින්නේ, මෙම 2023 අංක 9 දරණ දූෂණ විරෝධී පනතේ 67 වගන්තියේ උප වගන්ති 2,3 කියන උප

12 DEC 2025
උසාවි අංක 6

Scanned with CamScanner

වගන්ති, කොන්දේසි දැමීම අනිවාර්ය නැහැ. කොන්දේසි දැමිය හැකියි කියලා තිබෙන්නේ.

මා ඒ සම්බන්ධයෙන් ඔබතුමාගේ ගරු අධිකරණයට ගෞරවයෙන් කියවා සිටිනවා. 67 (1) වගන්තියේ මේ පනත යටතේ වරදක් හෝ ඊට වැඩි වැරදි ගණනක් සිදු කර ඇති බවට අධිචෝදනා ලබා ඇති තැනැත්තෙකුට එරෙහිව මහාධිකරණය ඉදිරියේ නඩු තීන්දුවක් ලබා දීමට පෙර කවර හෝ අවස්ථාවක අධ්‍යක්ෂක ජෙනරාල්වරයා විසින් කොමිෂන් සභාවේ අනුමැතිය සහිතව 2 වන උප වගන්තියේ නිශ්චිතව දක්වා ඇති කරුණු නිසි සැලකිල්ලට ගනිමින් හා 3 වන උප වගන්තියේ සඳහන් කරන ලද කොන්දේසි එකක් හෝ ඊට වැඩි ගණනකට යටත්ව මහාධිකරණයේ අවසරය මත ඒ චූදිතයාට එරෙහිව වන අධිචෝදනාව ඉල්ලා අස් කර ගනු ලැබිය හැකිය. යුතුය කියලා නොවේ තිබෙන්නේ. ඒ නිසා කොන්දේසිවලින් අපි බැඳී ඉන්නේ අපි ඒ කොන්දේසි වලට එකඟ වෙනවා නම්.

ඒ අනුව උතුමාණනි මට මේ කොන්දේසියට එකඟ වෙන්න බැහැ. අද දින ඔබතුමාගේ අධිකරණයේම අනෙකුත් විත්තිකරුවන් සම්බන්ධයෙනුත් නඩුවේ අධිචෝදනා පත්‍රය ඉල්ලා අස් කර ගැනීමට ඉඩ දීලා තිබෙනවා. ඔවුන් සම්බන්ධයෙන් අපරාධ නඩු විධාන සංග්‍රහයේ ප්‍රතිපාදන ඔබතුමාගේ අධිකරණයේ ඉල්ලීම කළේ. ඒ වගේම ඔවුන්ට කිසිම කොන්දේසියක් නැහැ. මේක මම 1 වෙනි විත්තිකරු තනිවම ගත්ත තීන්දුවක් නොවේ. 1 වෙනි විතතිකරුට මේක තනිවම ගෙවන්න කියන එක කොහොමටත් අසාධාරණයි. ඒක අපි කවදාවත් එකඟ වෙන්න බැහැ. මේක සාමූහිකව ගත්ත තීරණයක්. මේක සාමාන්‍යයෙන් ඔහුගේ දිනපතා ඔහුගේ රස්සාවේ හැටියට කරපු කටයුත්තක්. ඒ සියළු දෙනාම එහෙනම් එකසේ වගකියන්න ඕන.

12 DEC 2025

Scanned with CamScanner

මේ කොන්දේසිය සම්පූර්ණයෙන්ම අපිට වාසියක් වගේ පෙන්නුවාට ඇත්තටම ඒකෙන් කිසිම වාසියක් නැහැ. මොකද අපි පිළිගන්නේ නැහැ මේ ස්ථාවරය. එසේ හෙයින් එම කරුණුත් වාර්තා කර ඔබතුමාගේ අධිකරණයේ කරන ඕනෑම නියෝගයකට මා හිස නමන බව ගෞරවයෙන් සැලකර සිටිනවා.

**3,5 විත්තිකරුවන් වෙනුවෙන් සැලකර සිටිනුයේ,**

ස්වාමිනි, මෙම නඩුවේ 3,5 විත්තිකරුවන් කියලා කියන්නේ මහ බැංකුවේ සේවය කරපු රාජ්‍ය නිලධාරීන්. ඒ කාලසීමාවට අදාළව සේවය කරපු රජයේ නිලධාරීන්. මම මුලින්ම කියන්න ඕන අපි අද දිනයේ මේ මොහොත වෙනකල් අපි දැන ගෙන සිටියේ නැහැ මොකටද මෙම නඩුව කැඳවෙන්නේ කියලා. මොකද අල්ලස් කොමිසමෙන් අපිට දැනුම් දීමක් කලෙත් නැහැ අපි දැනගෙන සිටියෙත් නැහැ. මගේ සේවා දායකයෙක්ගේ ජංගම දුරකථනයට ලැබිච්ච වට්ස්ඇප් පණිවිඩයක් අනුව ඔබතුමාගේ ගරු අධිකරණයට කරන ගෞරවයක් විදියට තමයි අපි අද දිනයේ ගරු අධිකරණයේ පෙනී සිටින්නේ.

අල්ලස් කොමිසම විසින් දැනුම් දුන්නා අපරාධ නඩු විධාන සංග්‍රහයේ 194 (3) වගන්තිය යටතේ 3,4 විත්තිකරුවන් සම්බන්ධයෙන් අධිචෝදනා 4 ඉල්ලා අස් කර ගැනීමකට ඔබතුමාගේ අවසර අයැද සිටියා. ඒ සම්බන්ධයෙන් අපේ කිසිම විරුද්ධත්වයක් නැහැ.

එම්.එම්.එම්.මිහාල්,

මහාධිකරණ විනිසුරු-කොළඹ.

2025.12.10

දැන් වේලාව පෙ.ව.9.50 යි.

මෙතැන් සිට සටහන් කළේ ල/ලේ තේජා.

කොළඹ මහාධිකරණය 12 DEC 2025

Scanned with CamScanner

**<u>බස්නාහිර පළාත්බද කොළඹ මහාධිකරණය අංක 06 දීය.</u>**

**<u>කොළඹ මහාධිකරණ විනිසුරු එම්.එම්.එම්. මිහාල් මැතිතුමා ඉදිරිපිටදීය.</u>**

සටහන් කිරීම : එම්.එස්.පී. තේජා

**<u>නඩු අංකය: HCB 303/24</u>** **<u>දිනය: 2025.12.10</u>**

**(දැන් වේලාව පෙ.ව.09.50 යි. පෙර සටහන් ගැනීම ල.ලේ. ඉෂානි මිය විසිනි)**

ඒ සම්බන්ධයෙන් විරෝධතාවයක් නැහැ. අපි ස්වාමිනි රජයේ සේවකයින් වශයෙන් විතරයි කටයුතු කලේ. අපි මේ නඩුවේ මුල සිටම මූලික විරෝධතාවයක් ඔබ තුමාගේ පූර්වගාමී විනිසුරුතුමන් ඉදිරියේදීත් ගනු ලැබුවා. මේ නඩුවට ප්‍රස්තුත කාරණාව ඒකට අදාල වන ගනුදෙනුව, ඒ තීන්දු තීරණ ගත් ආකාරය ඒ පාර්ශව බොන්ඩ්ස් මිලදී ගත් ආකාරය මේ සියලුම කරුණු ස්වාමිනි, 2012 එස්සී එෆ්ආර් 457/2012 කියන නඩුවේ ස්වාමිනි ගරු ශ්‍රේෂ්ඨාධිකරණය විසින් සැලකීමට ලක් කරල තිබෙනවා. එහෙම සැලකීමට ලක් කරල තීන්දුවක් ලබා දීලා තිබෙනවා. රටේ තිබෙන අවසානාත්මක අධිකරණ විසින් තමයි ඒ තීන්දුව ලබාදීලා තිබෙන්නේ. දැන් මේ නඩුව අවසානයේ යම් පාර්ශ්වයකට යන්න තිබෙන අවසාන උසාවිය තමයි ශ්‍රේෂ්ඨාධිකරණය. ඒ අනුව අපි මුල ඉඳන්ම කිව්වේ අපි රාජ්‍ය සේවකයෝ. අපිට විරුද්ධව මේ නඩුව පවරා පවත්වාගෙන යන්න තරම් නඩු නිමිත්තක් නැහැ. වරදක් අනාවරණය වෙලා නැහැ. ඒ සම්බන්ධයෙන් දැනටමත් ශ්‍රේෂ්ඨාධිකරණය දීපු නඩු තීන්දුවක් තිබෙනවා . ඒකේ මේ සියලු කරුණු සළකා බලා තිබෙනවා. ඒ නිසා මුල ඉඳන්ම අපි මේ

බස්නාහිර පළාත් මහාධිකරණය
12 DEC 2025
උසාවි අංක 6

Scanned with CamScanner

නඩුවෙන් නිදහස් කරන්න කියලා නඩු නිමිත්තක් නැහැ කියලා. අපි ඒක මූලික විරෝධතාවයක් විදියටත් අරගෙන තිබෙනවා. ඒ නිසා ඉතාම ගෞරවයෙන් 194 වගන්තිය යටතේ නිදහස් කිරීමක් ලබාදෙන මෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. ඒ වගේම තවත් එක් කරුණක් වෙත අධිකරණයේ අවධානය යොමු කරනවා. ස්වාමිනි මේ නඩුව ඔබ තුමාගේ ගරු අධිකරණයේ පූර්ව නඩු විභාග සම්මන්ත්‍රණ අවධියේ තිබෙන්නේ. දැන් මේ පූර්ව නඩු විභාග සම්මන්ත්‍රණය ස්වාමිනි නැවත නියම කරල තිබෙනවා මේ මාසේ 17 වෙනිදට. ගිය දිනයේ ස්වාමිනි 3 සහ 5 විත්තිකරුවන් වෙනුවෙන්, මේ ඉල්ලීම කරන්නේ යම් විදියකින් 194(3) වගන්තිය යටතේ අධිචෝදනා ඉවත් කර ගැනීමක් නොකර මේ නඩුව ඉදිරියට යන්නේ නම් පමණයි. එතකොට ස්වාමිනි ගිය දිනයේ ගරු අධිකරණයට 3 සහ 5 විත්තිකරුවන් වෙනුවෙන් ලේඛණ ලැයිස්තුවක් ගොනු කලා ලේඛණ 31 ක් ඇතුළත්.

02 වන චූදිත වෙනුවෙන් සැලකර සිටින්නේ ,

මේ අවස්තාවේදී අපරාධ නඩු විධාන සංග්‍රහ පණතේ 193, 194 වගන්ති යටතේ අධිචෝදනාව ඉල්ලා අස්කර ගැනීමට මෙම නඩුවේ පැමිණිල්ල කරන යෝජනාව සම්බන්ධයෙන් අප එකග වෙනවා. එයට ස්තුති වන්ත වෙනවා. මොකද මුල සිටම මෙම නඩුවේ අප දැරූ ස්ථාවරය අල්ලස් කොමිසමට ඒ කාලයේ පටන් අප විසින් ඉදිරිපත් කරපු කරුණු වල සංෂිප්තය වෙන්නේ මේ 02 වන චූදිත මේ ශ්‍රී ලංකා මහ බැංකුවේ එම තනතුර දරණ අතරතුර මෙම නිළධාරීන් විසින් සිදු කර ඇති ආයෝජනය විදෙස් සංචිතවල සිදුකර ඇති ආයෝජනය මුදල් මණ්ඩලයේ සහ පිළිගත් විදේශ සංචිත ආයෝජන මූලධර්මයන්ට අනුකූළව විශේෂයෙන්ම ගත් තිරණයක්. ඒ වගේම විශේෂයෙන්ම වැඩි ප්‍රතිලාභයක් ලැබීම

Scanned with CamScanner

13

සදහා යම් අවධානමක් සහිත අඩු මුදලට මිලදී ගත හැකි විදේශ බැදුම්කර මිලදී ගැනීම ජාත්‍යන්තරව පිළිගත් විදේශ ආයෝජන ප්‍රතිපත්තියක්. ඒ වගේම මුදල් මණ්ඩලයේ අනුමතිය ලැබුණු ප්‍රතිපත්තියක්. හැබැයි ඉතා සුළු ප්‍රමාණයක් පමණයි එවැනි ආයෝජනයක යෙදී ඉන්නේ. මෙම නඩුවට අදාළ සිද්ධියේදී ඉතාම සුළු ප්‍රමාණයක් දශම ගාණක ප්‍රමාණයක් තමයි එම ආයෝජනයන්හි යොදවලා තිබෙන්නේ. ඒ යොදවලා තිබෙන්නෙත් අල්ලස් විමර්ශණ නිලධාරිනුත් දන්නවා, අපි කරුණු ඉදිරිපත් කරල තිබෙනවා විමර්ශණ අවස්ථාවේදීම. ඒ යොදවලා තිබෙන්නෙත් දීර්ඝ ලෙස අපි විමර්ශණය කරල ඔය අදාළ රටේ ආර්ථිකය ගොඩ නැගෙන බවට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ඇතුළු වෙනත් ආයතන ගණනාවක වාර්තා පරිශීලනය කිරීමෙන් පසුව. නමුත් අවාසනාවට ප්‍රතිපලය වශයෙන් පසු අවස්ථාවකදී ඒ රටේ ආර්ථිකය යම් අවධානමකට ලක් වීමක් නැවත සිදුවීම නිසා යම් අලාභයක් සිදු වෙලා තිබෙනවා. දැන් මගේ උගත් මිත්‍රයා සදහන් කරපු ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවෙන්ම ඉතා පැහැදිලිව සදහන් කර තිබෙනවා මේ ආයෝජන ප්‍රතිපත්තිය මත ක්‍රියා කරපු එක හරි. මේ ආයෝජන ප්‍රතිපත්තිය නිවැරදියි. මේ ආයෝජන ප්‍රතිපත්තිය මත මේ ආයෝජනය කිරීමේදී කිසිදු පටිපාටියක් උල්ලංඝනය වී නැහැ. කිසිදු වංචනික හෝ වෙනත් වරදකාරී ක්‍රියාවක් සිදු වෙලා නැහැ. එම නඩු තීන්දුවේ තිබෙනවා යම් තීරණයක ප්‍රතිපලය මත පමණක් පිහිටලා ඒ තීරණය වැරදියි හෝ ඒ තීරණය වංචා සහගතයි කියලා අනුමිතියකට එළඹෙන්න බැහැ කියලා එම ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවේ තිබෙන්නේ, එවකට හිටපු විගණකාධිපතිවරයාගේ වාර්තාවක් ඒ වගේම එම අවස්ථාව වන විට සිටි මහ බැංකු අධිපතිවරයාගේ වාර්තාවකුත් සැලකිල්ලට අරගෙන. ඒ අනුව මැතිතුමණි, එම කරුණු තමයි අප ඉදිරිපත් කලේ මුල සිටම.

12 DE 2025

Scanned with CamScanner

මේ තත්ත්වය යටතේ මේ නිළධාරීන් තමන්ගේ රට වෙනුවෙන් තමන්ගේ රාජකාරිය ඉටු කරන අවස්ථාවේදී මහ බැංකුවේත් ජාත්‍යන්තර පිළිගත් ප්‍රතිපත්තීන්ට අනුකූලව ගත් තීරණයක්. වෙනත් රටක ඉන් පසුව ඇති වූ තත්ත්වයක් මත යම්කිසි අලාභයක් වෙලා තිබෙනවානම් ඒ අලාභය මේ තැනැත්තන් අපරාධ වරදකට වරදකරු කිරීමට හෝ පුද්ගලිකව වන්දි ගෙවීමට අවශ්‍යතාවයක් නැහැ. ඒ කාරණය පිළි ගන්නවා. ඒ නිසා තමයි මා සිතනවා මේ අධිචෝදනා පත්‍රයේ මගේ සේවා දායකයා සහ අනෙකුත් අය සම්බන්ධයෙන් ඉවත් කර ගැනීමට සූදානම් වෙලා ඉන්නේ.

නමුත් ඒකට එක්තරා විත්තිකරුවෙකුගෙන් වන්දියක් බලාපොරොත්තු වෙනවා කොන්දේසියක් හැටියට. ඒ අනුව අධිචෝදනා පත්‍රය ඉල්ලා අස්කර ගන්නවානම් අප එයට සම්පූර්ණයෙන් එකගයි. එසේ නොවී නඩු විභාගයට දිගටම ගෙන යාමට ගරු අධිකරණය තීරණය කරන්නේ නම් මීට පෙර අප ඉල්ලා සිටි ලේඛණ සම්බන්ධයෙන් නැවතත් කරුණු සැල කිරීමට අවසර අයැද සිටිනවා.

---

<u>නි යෝ ග ය.</u>

අද දින පැමිණිල්ල වෙනුවෙන් ඉදිරිපත් කරන ලද ඉල්ලීම පිළිබඳව මාගේ අවධානය යොමු කරමි.

ඒ අනුව පැමිණිල්ල විසින් 2023 අංක 09 දරණ දූෂණ විරෝධි පණතේ 67(1) වගන්තිය ප්‍රකාරව 01 වූදිතට එරෙහි වන අධිචෝදනා පැමිණිල්ලේ කොන්දේසි වලට යටත්ව ඉල්ලා අස්කර ගැනීමට අවසර අයැද ඇත.

12 DEC 2025
කොළඹ - 12

Scanned with CamScanner

එසේම 2, 3, 5 චූදිතයින්ට විරුද්ධව අපරාධ නඩු විධාන සංග්‍රහ පණතේ 194(3) වගන්තිය යටතේ වූ අධිචෝදනා ඉල්ලා අස් කර ගැනීමට අවසර අයැද ඇත.

ඉදිරිපත්ව ඇති කරුණු සළකා බලමි. ඒ අනුව මෙම නඩුවේ 01 වන චූදිතට විරුද්ධව ගොනු කර ඇති අධිචෝදනා දූෂණ විරෝධී පණතේ 67(1) වගන්තිය ප්‍රකාරව පැමිණිල්ලෙන් නියම කර ඇති කොන්දේසි වලට යටත්ව ඉල්ලා අස්කර ගැනීමට අවසර ලබා දෙමි.

2, 3, 5 චූදිතයින්ට විරුද්ධව ඉදිරිපත් කර තිබෙන අධිචෝදනා අපරාධ නඩු විධාන සංග්‍රහ පණතේ 194(3) වගන්තිය අනුව ඉල්ලා අස්කර ගැනීමට අවසර ලබා දෙමි.

ඒ අනුව දූෂන විරෝධි පණතේ 67(1) වගන්තිව ප්‍රකාරව 01 චූදිතට එරෙහි අධිචෝදනා ඉල්ලා අස්කර ගැනීම මත 01 වන චූදිත නිදහස් කරමි.

අපරාධ නඩු විධාන සංග්‍රහ පණතේ 194(3) වගන්තිය අනුව අධිචෝදනා ඉල්ලා අස්කර ගැනීම මත 2, 3 සහ 5 වන චූදිතයන් නිදහස් කිරිමට තීරණය කරමි. ඒ අනුව නඩු කටයුතු අවසන් කරමි.

**2025.12.17** දින කැඳවීම අනවශ්‍යයි.

**(එම්.එම්.එම්.මිහාල්)**

**මහාධිකරණ විනිසුරු - කොළඹ.**

**2025.12.10**